29 JAN 2008


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 1,517/19 – 2007 ඔක්තෝබර් 03 වැනි බදාදා – 2007.10.03

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**රේගු නිවේදනය (සාමාන්‍ය)**

රේගු ආඥාපනත

රේගු ආඥාපනතේ (235 වන අධිකාරය) 103 වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා විසින් පනවනු ලබන නියෝග.

රංජිත් සියඹලාපිටිය,
*වැඩ බලන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍ය.*

2007 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

**103 වගන්තිය**

*නියෝග*

*මාර්ගස්ථ භාණ්ඩ හා භාණ්ඩ නැවෙන් නැවට මාරු කිරීම :*

1. මෙම නියෝග නිකුත් කරනු ලබන්නේ "නැව් භාණ්ඩ පිළිබඳව වාර්තා කිරීමට නැවෙන් නැවට පැටවීමට හා නැවත නැව්ගත කිරීමට ප්‍රථම නැව්වල ක්‍රියාකාරීත්වය" යන ශීර්ෂය යටතේ 2006 මාර්තු 10 දින හා අංක 1435/21 දරන අතිවිශේෂ *ගැසට්* නිවේදනයේ පළකරන ලද නියෝගවලට අමතර වශයෙනි.

2. මාර්ගස්ථ භාණ්ඩ හා භාණ්ඩ නැවෙන් නැවට මාරු කිරීම පිළිබඳ රේගු පාලනය කිරීම් යටතේ භාණ්ඩ රේගු ආඥාපනතේ 37 වන වගන්තිය ප්‍රකාර අවශ්‍ය යැයි හැඟෙන සෑම අවස්ථාවක දීම ශ්‍රී ලංකා රේගුව විසින් පරීක්ෂා කරනු ලැබීමට යටත්විය යුත්තේ ය.

3. බෑමට අදහස් නොකරනු ලබන සියළු භාණ්ඩ (මාර්ගස්ථ ) හෝ ශ්‍රී ලංකා රේගු බල ප්‍රදේශයේ පිටත ගමනාන්තයන් සඳහා වූ භාණ්ඩ (නැවෙන් නැවට පැටවීමේ ) පිළිබඳ රේගු ආඥා පනතේ 28 වන වගන්තියේ නියම කර ඇති ආකාරයට ශ්‍රී ලංකා රේගුවට වාර්තා කළ යුතු බවට වගබලා ගැනීම භාණ්ඩ ප්‍රවාහනය කරන්නාගේ වගකීම වේ.

1A—G 008933—620 (2007/10)

4. (i) යම් නිශ්චිත ස්ථානයක දී අදාළ භාණ්ඩ පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලෙස ශ්‍රී ලංකා රේගුව විසින් නැවක දේශීය නියෝජිතයාට හෝ නැවක අයිතිකරුගේ දේශීය නියෝජිතයාට දැනුම්දිය යුතු ය.

(ii) ඊට සහභාගිවීම, මෙම කාරණයට විෂය වන භාණ්ඩ තබා ඇති පර්යන්තය භාර අදාළ වරාය පර්යන්ත ක්‍රියාකරු වෙතද ශ්‍රී ලංකා රේගුව විසින් දැනුම් දිය යුතුය.

5. අදාළ භාණ්ඩ ශ්‍රී ලංකා රේගුව විසින් පරීක්ෂා කර බැලීම සඳහා වරාය පර්යන්ත ක්‍රියාකරුගේ සම්බන්ධීකරණය ඇතිව යම් නිශ්චිත ස්ථානයක දී ඉදිරිපත් කිරීම නියෝජිතයාගේ වගකීම වන්නේ ය.

6. පරීක්ෂණ ක්‍රියාවලිය අවසන් වීමෙන් අනතුරුව චෝදනාවක් නොමැති නම්, නැවත නැව්ගත කිරීම සඳහා ශ්‍රී ලංකා රේගුව නිශ්කාෂණ අවසරය නිකුත් කළ යුත්තේ ය.

7. ශ්‍රී ලංකා රේගුවෙන් නැවත නැව්ගත කිරීම සඳහා නිශ්කාෂණ අවසරය ලැබෙනතුරු එසේ පරීක්ෂණය සඳහා ඉල්ලා ඇති භාණ්ඩ කිසිවක් පර්යන්ත ක්‍රියාකරු විසින් නැවත නැව්ගත කිරීම සඳහා කටයුතු නොකළ යුතුය.

8. ඉල්ලා ඇති භාණ්ඩ නැවෙන් බෑම, ප්‍රවාහනය හා පරීක්ෂණය සඳහා නිශ්චිත ස්ථානයකට ගෙන ඒමත්, එම භාණ්ඩ මැන බැලීම, ගණන් කිරීම, ඇසුරුම් ඉවත් කිරීම, නැවත ඇසිරීම හා ඒවා විවෘත කිරීම හා වැසීම ද, ඒවා නියමිත ස්ථානයකට ගෙන ගොස් තැබීම ද නියෝජිතයා විසින් තමාගේම වියදමින් කළ යුතු අතර අවදානම ද තමාම දරමින් කළ යුතු වේ.

9. තහනම් කළා වූ ද, සීමා කර ඇත්තාවූ ද, සියලුම ආකාරයේ තහනම් භාණ්ඩ හෝ සමූහ විනාශයක් කිරීමට යොදා ගන්නා කවර ආකාරයක හෝ ආයුධ ද නැතහොත් මිනිස් ජීවිතයට, ශාක ජීවිතයට, සත්ව ජීවිතයට හෝ පරිසරයට තර්ජනයක් වන හෝ තර්ජනයක් විය හැකි අන්තරායකර හෝ වෙනත් භාණ්ඩ ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ගේ අදහස් අනුව අපරාධයට හේතුවක් වන වෙනත් ඕනෑම භාණ්ඩයක් භාරයට ගෙන තහනම් කොට රේගු අධ්‍යක්ෂ ජනරාල් විසින් සුදුසු ආකාරයකින් ක්‍රියාකිරීම සඳහා නියෝග කරනු ලැබිය හැකි පරිදි විනාශ කර දැමීමට හෝ පරිහණය කිරීමට නිසි නිලධාරීන්ට පැවරීම කළ යුත්තේ ය.

10 – 620

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
# The Gazette of the Democratic Socialist Republic of Sri Lanka
EXTRAORDINARY

අංක 1517/19- 2007 ඔක්තෝබර් 03 වැනි බදාදා - 2007.10.03
No. 1517/19 – WEDNESDAY, OCTOBER 03, 2007

(Published by Authority)

## PART I : SECTION (I) — GENERAL

### Government Notifications

#### CUSTOMS NOTIFICATION (GENERAL)

**The Customs Ordinance**

REGULATIONS made by the Minister of Finance and Planning by virtue of the powers vested in him by Section 103 of the Customs Ordinance (Chapter 235).

RANJITH SIYAMBALAPITIYA,
*Actg*. Minister of Finance and Planning.

Colombo,
28th September, 2007.

SECTION 103

REGULATIONS

CUSTOMS CONTROLS ON CRANSIT AND TRANSHIPMENT OF GOODS

1. These Regulations are further to the regulations published under the caption of "Working of Ships before Report and Transshipment and Reshipment of Cargo" by the Extraordinary *Gazette* Notification No. 1435/21 of March 10, 2006.

2. Under the Customs Controls on Transit and Transshipment of goods, the transit and transshipment goods shall be subjected for inspection by the Sri Lanka Customs as and when deem necessary in accordance with Section 37 of the Customs Ordinance.

3. It is responsibility of the carrier to ensure that all goods not meant to be unloaded (transit) or meant for destinations outside the Sri Lanka Customs territory (transshipment) shall be reported to the Sri Lanka Customs in the manner laid down in Section 28 of the Customs Ordinance.

4. (i) Sri Lanka Customs shall notify the local agent of a ship or the local agent of the owner of the ship, to produce the relevant goods for inspection at a designated place.

(ii) Simultaneously, the respective Port Terminal Operator on whose terminal the subject goods are laying will also be notified by the Sri Lanka Customs.

5. It is the responsibility of the agent with the coordination of the terminal operator to produce the relevant goods to a designated place for inspection by Sri Lanka Customs.

6. Sri Lanka Customs shall issue clearance for re-shipment after completing inspection process and if no incrimination is found.

7. No goods so requested for inspection shall be laden for re-shipment by the terminal operator until receipt of advice of clearance for re-shipment from the Sri Lanka Customs.

8. The unshipping, transporting and bringing of the requested goods to the designated place for examination and the measuring, counting, unpacking and repacking, and the opening and closing of the same, and removing to and placing them in the proper place of deposit shall be performed by and at the expense and risk of the agent.

9. Goods which are prohibited restricted and contraband of all description, or any form of weapons of mass destruction or any dangerous or other goods that pose or likely to pose a threat to either human, plant or animal life or the environment or any other goods which, in the opinion of the Director General of Customs is incriminatory shall be seized and forfeited and shall be destroyed or disposed of or assigned to the appropriate authorities for action as the Director General of Customs may direct.

10-620

PRINTED AT THE DEPARTMENT OF GOVERNMENT PRINTING, SRI LANKA.